ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2016-06-24 |

පැමිණිලිකරු : මහින්ද සාගර විලේගොඩ ලියනගේ මයා,
අංක 35, ඇටිකෙහෙල්ගල්ල,
වැලිවේරිය.

වගඋත්තරකරුවන් : 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. අධ්‍යක්ෂ (නීති),
නීති කොට්ඨාශය,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

03. අධ්‍යක්ෂ (පිරිස් හා මානව සම්පත්),
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

04. අධ්‍යක්ෂ,
පොලිස් අභ්‍යාස විද්‍යාලය,
කළුතර.

**පැමිණිලි අංකය : HRC/2856/13**

ඉහත අංකය යටතේ වර්ෂ 2013 ක් වූ ඔක්තෝබර් මස 21 වන දින පැමිණිලිකාර මහින්ද සාගර විලේගොඩ ලියනගේ යන අය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කර ඇති පැමිණිල්ලට අදාළ පියවර ගෙන දෙපාර්ශවයේ කරුණු ලිඛිතව ලබා දුන් පසු කොමිෂන් සභාව ඉදිරියේ වැඩිදුර පරීක්ෂණ පවත්වා ඒ අනුව පැමිණිල්ලට අදාළව ගන්නා ලද තීරණයන් සහ නිර්දේශයන් පහත පරිදි ඉදිරිපත් කරනු ලැබේ.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165, කින්සි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 011-2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2696470
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர் / Secretary: 011-2689558
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2689558, 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**පැමිණිල්ලෙන් දක්වා ඇති කරුණු දැක්වීම :-**

පැමිණිලිකරු තම පැමිණිල්ල ඉදිරිපත් කරමින් මූලිකව සඳහන් කර ඇත්තේ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස සේවය කරමින් සිටියදී සේවයට වාර්තා නොකළ දින හෝ කාලවකවානුවක් සඳහා ඉදිරිපත් කළ වෛද්‍ය වාර්තා නොසලකා හැර තමා සේවය අතහැර ගිය අයෙකු බවට සලකා සේවය අවසන් කර ඇති බවද ඒ පිළිබඳව කරුණු දක්වා ආයතන සංග්‍රහයට අනුව සුදුසු අභියාචනා ඉදිරිපත් කළද ඒවා නොසලකා හැර පොලිස් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර ඇති බවත්ය.

උප පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස 1986-02-10 දින පොලිස් සේවයට ඇතුළත්ව 1993-03-20 දින පොලිස් පරීක්ෂක තනතුරට ද 2006-04-21 දින ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට ද පත්ව උසස්වීම් ලබා දිවයිනේ සෑම ප්‍රදේශයකම සේවය කළ බව පැමිණිල්ලෙන් දක්වා ඇත. වැලිකඩ පොලිස් ස්ථානයේ සේවය කරමින් සිටියදී කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයට ස්ථාන මාරුවක් ලද බවද ඒ වනවිටද අසනීප තත්වයකින් සිටි පැමිණිලිකරු කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයට ඉදිරිපත්ව කටයුතු කිරීමට නොහැකි වීම සම්බන්ධව වෛද්‍ය වාර්තා ඉදිරිපත් කළබවද අදාළ ලේඛන වල පිටපත් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත.

2007-12-13 වන දින ලියාපදිංචි තැපැල් මගින් පැමිණිලිකරු ඉදිරිපත් කළ වෛද්‍ය සහතිකය 2007-12-17 වන දින පොලිස් අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂ වෙත ලැබී තිබියදී එය නොලැබුනු ලෙස සලකා 2007-12-17 දිනම සේවය අතහැර යාමේ නියෝගයක් නිකුත් කර ඇති බව දක්වා ඇති අතර තමා වෛද්‍ය සහතික ලියාපදිංචි තැපැල් මගින් යැවූ බවට කරුණු තහවුරු කිරීමට අදාළ ලියාපදිංචි තැපැල් කුවිතාන්සියේ හා වෛද්‍ය සහතිකයේ පිටපත් තම පැමිණිල්ලට අමුණා ඉදිරිපත් කර ඇත. තැපැල් දෙපාර්තමේන්තුව එකී ලිපිය නිසි පරිදි භාර දුන් බවටද කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පොලිස් අධිකාරී විසින් ලිපි භාර ගැනීමේ ලේඛනයේ සටහන් තබා එය ලද බවටද අදාළ වාර්තාවන්හි පිටපත් ද අමුණා ඉදිරිපත් කරමින් කරුණු ඉදිරිපත් කර ඇත.

2007-12-24 දින සේවය අතහැර යාමේ නියෝගය ලද පසු දින 7 ක් ඇතුළත පැමිණිලිකරු ඉදිරිපත් කළ අභියාචනය ලියාපදිංචි තැපැලෙන් යවා ඇති අතර, එකී අභියාචනය හා වෛද්‍ය සහතිකය වගඋත්තරකරුවන් විසින් නොසලකා හැර කටයුතු කර ඇති බවද ඒවා ලැබුණු බවට දැනුම්දීමක් හෝ නොකළ බවද පෙන්වා දී ඇත.

2010-05-07 දින පැමිණිලිකරු පොලිස් මූලස්ථානයට ද හිටපු ආරක්ෂක ලේකම්වරයාට අභියාචනා කර ඇති අතර පොලිස් මූලස්ථානය වෙත ඉදිරිපත් කළ අභියාචනය සඳහා කළුතර

පොලිස් අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂවරයා විසින් පැමිණිලිකරුගේ නොකැළැල් හා දීර්ඝ සේවා කාලය ද පැමිණිලිකරු පොලිස් සේවයේ සිටියදී කරන ලද දක්ෂතාවයන් පිළිබඳ සලකා බලා නැවත සේවය ලබා දෙන ලෙසට 2010-05-18 දින නිර්දේශයක් ඉදිරිපත් කර ඇති බවද සඳහන් කර ඇත.

වගඋත්තරකරුවන් විසින් නැවත සේවය ලබා ගැනීමට පැමිණිලිකරුට හැකියාවක් නොලැබෙන සේ ද්වේශ සහගතව සකස් කරන ලද වාර්තාවක් තිබූ බවට පැමිණිලිකරු විසින් වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කර ඇති. එය තවදුරටත් තහවුරු කිරීමට පැමිණිලිකරු 2007-11-19 දින වේයන්ගොඩ පොලිස් ස්ථානයේ තමා ගොනු කළ පැමිණිල්ලක් ඇති බවද එදින රාත්‍රියේ පුද්ගලයින් කිහිප දෙනෙකු තමා නොමැති අවස්ථාවක නිවසට පැමිණ බිරිදට තර්ජණය කර නිවසේ ඇති කළ සුනඛයාට වෙඩි තබා ඝාතනය කිරීම සම්බන්ධ පැමිණිල්ල වේයන්ගොඩ පොලිස් ස්ථානයේ CIB II 376/280 හි ඇතුළත් කළබවද 2007-11-25 දින නැවත නිවසට පැමිණි නාඳුනන පුද්ගලයින් පිරිසක් තමා පිළිබඳ විමසා තර්ජණය කිරීමක් සම්බන්ධව හා වැලිකඩ පොලිසියේ රාජකාරි කරමින් සිටියදී රාත්‍රියේ පැමිණ අහසට වෙඩි තබා පලායාමක් සම්බන්ධව තම ආරක්ෂාව පිණිස කළ පැමිණිල්ලක් තම නිවස පිහිටි පොලිස් වසම වන වේයන්ගොඩ පොලිස් ස්ථානයේ CIB II 147/409 හි ගොනු කළ බවද දක්වා ඇත.

2007-11-25 දිනට ආසන්න දිනක විෂ සහිත සර්පයෙකු කළ දෂ්ට කිරීමක් මත වූ රෝගී තත්වයක් මත ශරීරය පුරා ඇතිවූ තුවාල ආසාධනයට ලක්වී රෝගී තත්වයකට පත්ව ප්‍රතිකාර ගැනීමට සිදුවූ බවද එය වෛද්‍ය සහතිකයක් මගින් තහවුරු කර ඇති බවද පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. අසනීප සඳහා වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර තිබූ කාලසීමාවේදී මාසයක පමණ කාලයකට විදේශ ගතවූ බව සත්‍යයක් බවද එය තමාට සහ තම පවුලේ සාමාජිකයින්ට තිබූ මරණීය තර්ජණ හේතු කොට ගෙන සිදුව තිබූ බවද නිසි පරිදි වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර තිබියදී ඒවා නොසලකා හැර ද්වේශ සහගතව සේවය අතහැර යාමේ නියෝගයක් නිකුත් කර ඇති බවද තම පැමිණිල්ල තුලින් සඳහන් කර ඇත. නියමිත පරිදි නිවාඩු අනුමත කිරීමකින් තොරව සේවයට වාර්තා නොකළ බවට දක්වා නැවත සේවය ලබා නොදී සිටීමට තරම් හේතුවූ කරුණු නොතිබියදී බරපතල ගණයේ විනය කඩකිරීමක් කඩ කළ අයෙකුට කරනු ලබන දඬුවමක් ලෙස සේවය අවසන් කරන ආකාරයකට තමාට කරන ලද නොසලකා හැරීම සම්බන්ධව ඉදිරිපත් කළ අභියාචනා වගඋත්තරකරුවන් විසින් නොසලකා හැර ඇති බවද දක්වා ඇත. නොදන්වා සේවයෙන් නිවාඩු ලබා ගත් අය හට සේවය අතහැර යාමේ නියෝග නිකුත් කළ පසු එකී තැනැත්තන් විසින් ඉදිරිපත් කළ අභියාචනා සලකා බලා ගන්නා ලද තීරණ කිහිපයක් පිළිබඳවද පැමිණිලිකරු විසින් කරුණු ඉදිරිපත් කර ඇත. එනම් 2005 වසරේදී සේවය අතහැර යාමේ නියෝගයක් ලද පොලිස් පරීක්ෂකවරයෙකු හට ඉන් වසර 10 කට පසු එනම් 2008 වසරේදී නැවත සේවය ලබාදී ඇති ආකාරය ද නියමිත පරිදි නිවාඩු අනුමත කිරීමකින් තොරව

විදේශ ගතවූ නිලධාරියෙකු හට තරවටු කිරීම නමැති ආයතන සංග්‍රහයේ II වන උප ලේඛනයේ සඳහන් දඬුවමක් පමණක් ලබාදී ඇති ආකාරය ද දක්වා ඒවා තහවුරු කිරීමට අදාල කරුණු ඉදිරිපත් කර ඇත. ඒ අනුව නීතිය ක්‍රියාත්මක කරවීමේදී සැමට සර්ව සාධාරණ වියයුතුය යන සිද්ධාන්තය මත තමා වෙනුවෙන් ද සාධාරණ ලෙස සලකා බැලීමට හැකියාව ආයතන සංග්‍රහය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුලින් දක්වා තිබියදී කරන ලද නොසලකා හැරීම මත තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවද පෙන්වා දී ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

2013-11-01 දින 01 වන වගඋත්තරකරු වෙත මෙම පැමිණිල්ලට අදාලව කරුණු දැක්වීමට දන්වා එහි පිටපතක් පොලිස් මූලස්ථානයේ පිරිස් හා පාලන අංශයේ නියෝජ්‍ය පොලිස්පති වෙතද ඉදිරිපත් කරන ලදී. එයට අදාල වාර්තාව 02 වන වගඋත්තරකාර පොලිස් නීති කොට්ඨාශයේ අධ්‍යක්ෂ විසින් තම අංක OW/PLD/HRC/103/829/13 යටතේ 2013-12-17 දින එවා ඇත. එහි දක්වා ඇත්තේ පැමිණිලිකරු වැලිකඩ පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කරමින් සිටියදී වහාම ක්‍රියාත්මක වන පරිදි කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයට ස්ථාන මාරු කර ඇති බවත් 2007-11-16 දින පොලිස්පතිතුමාගේ අංක D/MD/ADM/1664/2007 දරණ දුරකථන පණිවිඩයට අනුව සිදු කළ බවත්ය. නමුත් පැමිණිලිකරු තමා අසනීප බව දන්වා වැලිකඩ පොලිසියේ තොරතුරු පොතේ සටහන් යොදා පිටව ගොස් තිබූ බවට වැලිකඩ පොලිසියේ ස්ථානාධිපති විසින් කළුතර පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ වෙත දුරකථන පණිවිඩයක් ලබාදී ඇති අතර, ඒ අනුව 2007-11-16 දින සිට දින 3 ක් නිවාඩු අනුමත කර තිබූ බවද එකී කාලය අවසන් වී පැමිණිලිකරු රාජකාරියට වාර්තා කර නැති බැවින් 2007-12-10 වන දින දුරකථන මගින් දන්වා සිටි බවද නමුත් සේවයට වාර්තා කර නොතිබූ බවද සඳහන් කර ඇත. පැමිණිලිකරු විසින් තමා අසනීප බව දක්වා වෛද්‍ය වාර්තාවක් 2007-12-03 දින ලියාපදිංචි තැපැල් මගින් එවා ඇති බවද එම වෛද්‍ය වාර්තාව අනුව 2007-11-22 දින සිට 2007-12-05 දින දක්වා දින 14 ක නිවාඩු කාලයක් අනුමත කළ බවද පිළිගෙන ඇත. නිලධාරියා වෙත සේවය අතහැර යාමේ නියෝගය නිකුත් කල පසු වසර 2 1/2 කට පමණ පසුව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවද ඔහු නැවත සේවයේ පිහිටුවීම අනුමත නොකරන බව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් තම අංක POL/62/585/11 හා 2011-03-31 දින නියෝගයක් නිකුත් කළ බවද දක්වා ඇත. පසුව මෙම පැමිණිලිකරු රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත කළ අභියාචනයක්ද ප්‍රතික්ෂේප කර ඇති බව දක්වා ඇත.

2013-12-19 දින 02 වන වගඋත්තරකාර අධ්‍යක්ෂක පොලිස් නීති කොට්ඨාශය විසින් එවා ඇති වාර්තාවක් ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ පොලිස් මූලස්ථානයේ අධ්‍යක්ෂක පිරිස් හා මානව සම්පත් වෙතින් ලබා ගන්නා ලද වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කරන අතර එකී වාර්තාවේ

සඳහන් කර ඇත්තේ මූලික වශයෙන් පැමිණිලිකරුගේ මුල් පත්වීමේ හා පසුව ලද උසස්වීම් වලට අදාළ තොරතුරු වේ. පැමිණිලිකරු සේවයට වාර්තා නොකර සිටීම මත 04 වන වගඋත්තරකාර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂක විසින් 2010-12-17 දින තම අංක SD/499/2007 යටතේ 2007-12-06 වන දින සිට නිසි පරිදි නිවාඩු ලබා නොගෙන රාජකාරියට වාර්තා නොකිරීමේ හේතුව මත තනතුර අතහැර ගියා සේ සලකා කටයුතු කරන බවට දන්වා නියෝගයක් නිකුත් කළබවට දන්වා ඇත. සේවය අතහැර යාමේ නියෝගය ඉවත් කර ගැනීම සඳහා පැමිණිලිකරු අභියාචනා ඉදිරිපත් කර ඇති අතර, ඒවා ප්‍රතික්ෂේප වී ඇති බවද එකී ප්‍රතික්ෂේප වූ කරුණු වගඋත්තරකරුගේ ප්‍රකාශයේ මුල් අවස්ථාවේ දක්වා ඇති පරිදිම බව අධ්‍යක්ෂක පිරිස් හා මානව සම්පත් අංශය විසින් වාර්තා කර ඇත.

**පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-**

2013-12-19 දින පළමු පරීක්ෂණය කොමිෂන් සභාව ඉදිරියේදී පවත්වා ඇත. එහිදී මහජන පෙත්සම් කාරක සභාව 2012-01-26 දින ඉදිරිපත් කර ඇති ලිපියේ කරුණු කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත. ඒ අනුව මහජන පෙත්සම් කාරක සභාව විසින් දක්වා ඇත්තේ පැමිණිලිකරු නිවාඩු ආවරණය කරගෙන ඇති බවට සාක්ෂි මගින් කරුණු අනාවරණය කරගෙන ඇති බැවින් සේවය අතහැර යාමේ නියෝගය නිකුත් කිරීම බැලූ බැල්මට අසාධාරණ වන බවත් එබැවින් විධිමත් පරීක්ෂණයක් සිදු කළයුතු බව ලිඛිතව පොලිස්පති වෙත දන්වා ඇති බවද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරන පරීක්ෂණ සඳහා පෞද්ගලිකව ඉදිරිපත් වී කරුණු දැක්වීමට මැදිහත් වන ලෙසද පවසා ඇති බව පෙන්වා දෙන ලදී. එකී පරීක්ෂණ වල ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් මහජන පෙත්සම්කාරක සභාවේ දැන්වීමේ දින සිට මාස දෙකක් තුළ දැන්විය යුතු බව කියා ඇති අතර, එහි පිටපත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතද රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙතද පොලිස් මූලස්ථානයේ මානව සම්පත් අංශයේ අධ්‍යක්ෂක වෙතද යවා ඇති බව පෙන්වා දෙන ලදී. රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත්ව කරුණු දැක්වීමට අවස්ථාවක් දෙන ලෙසද එය මහජන පෙත්සම් කාරක සභාවේ නියමය පරිදි සිදු කරන බවද එම ලිපියේ විශේෂයෙන් දක්වා ඇතත් පැමිණිලිකරුට එවැනි අවස්ථාවක් කිසිදු අවස්ථාවක නොදුන් බව පැමිණිලිකරු දන්වා ඇත.

2013-02-13 වන දින 02 වන වරට පරීක්ෂණ කටයුතු සඳහා දින නියම කර පැමිණිලිකරුද වගඋත්තරකරුවන් ලෙස පොලිස්පති, අධ්‍යක්ෂක(නීති), අධ්‍යක්ෂක (පිරිස් හා මානව සම්පත්) යන පොලිස් මූලස්ථානයේ නිලධාරීන්ද කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂවරයාටද ඉදිරිපත්වීමට දන්වා ඇති නමුත් පරීක්ෂණය සඳහා ඉදිරිපත්ව සිටියේ පොලිස් මූලස්ථානය වෙනුවෙන් ඉදිරිපත් වූ නිලධාරීන් පමණක් බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු සේවයට වාර්තා නොකලේ නොදන්වාද යන්න හා පැමිණිලිකරුගේ පළවෙනි අභියාචනය ලද පසු සලකා බලන ලද්දේ ද යන්න විමසා සිටීමේදී වගඋත්තරකරුවන් දන්වා ඇත්තේ මූලික අභියාචනයක් ලැබී නොමැත යන පිළිතුර පමණි. මූලික අභියාචනයක් නිකුත් කරන ලද්දේ ද යන්න පැමිණිලිකරු වෙතින් විමසා සිටීමේදී සඳහන් කර ඇත්තේ සේවය හැර යාමේ නියෝගය ලද පසු සතියක් තුළ මූලික අභියාචනය ඉදිරිපත් කළ බවය.

අනතුරුව නැවතත් කොමිෂන් සභාව විසින් වගඋත්තරකරුවන් වෙතින් වාර්තාවක් කැඳවා ඇති අතර එම වාර්තාවෙන් පැමිණිලිකරු පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කර ඇති නමුත් පැමිණිල්ලට අදාලව විසඳිය යුතු කාරණා අනුව තිබිය යුතු කරුණු කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටි ආකාරයට ඉදිරිපත් කර තිබී නොමැති බවද නිරීක්ෂණය වේ. ඒ අනුව එම වාර්තාව ප්‍රමාණවත් නොවන බැවින් නැවත නිවැරදි ලෙස කරුණු ඉදිරිපත් කරන ලෙසට වගඋත්තර පාර්ශවය වෙත දැනුම්දීම් කර ඇත. අනතුරුව නැවතත් 2014.08.08 දින වැඩිදුර පරීක්ෂණ කටයුතු සිදුකර ඇති අතර එහිදී වගඋත්තරකරුවන් නිසි පරිදි තම කරුණු ඉදිරිපත් කර ඇත. නමුත් කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලය නියෝජනය කරමින් එහි අධ්‍යක්ෂවරයාටද පැමිණීමට නියම කර තිබුණද ඉදිරිපත්ව නොතිබීමේ හේතුව මත පැමිණි වගඋත්තරකරුවන් ඉදිරිපත් කළ පිළිතුරු වාර්තා කිරීමෙන් අනතුරුව නැවත කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂ හට ඉදිරිපත් වීමට සිතාසි මඟින් දන්වා ඇත. 2014.09.12 දිනද එකී වගඋත්තරකරුවන් ඉදිරිපත්ව නොතිබීමේ හේතුව මත මෙම ගොනුවේ කටයුතු අවසන් කර ගැනීමට වගඋත්තරකරුවන් සිතාසි ප්‍රකාරව එක්වර ඉදිරිපත් නොවීමෙන් හා වගඋත්තරකරුවන් වරින් වර ඉදිරිපත් වීමද දින ඉල්ලා සිටීමද කරුණු ඉදිරිපත් කිරීමේදී ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් නොකිරීමද යන හේතූන් ද මත පැමිණිලිකරුට තම ගොනුවේ කටයුතු කඩිනමින් අවසන් කර ගැනීමට නොහැකි බව පවසා තම පීඩාව පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇත. ඒ අනුව නැවත සිතාසි ප්‍රකාරව 2014.10.09 දින කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක එච්.ජී.එන්.කේ.ඩී. විජේසිංහ මහතා ඉදිරිපත්ව කරුණු ඉදිරිපත් කර ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිල්ලට අදාළ කරුණු ද පැමිණිල්ල සමඟ අමුණා ඉදිරිපත් කර ඇති පැමිණිලිකරුගේ ලේඛනද පසුව ඉදිරිපත් කළ ලිඛිත දේශන ද හා වගඋත්තරකරුවන්ගේ කරුණු වාර්තා කිරීමද ලිඛිත දේශනද පරීක්ෂණ අවස්ථාවේ දෙපාර්ශවය ඉදිරිපත් කළ කරුණු හා කොමිෂන් සභාවේදී විමසා සිටි විසඳිය යුතු ප්‍රශ්න වලට ලබා දුන් දෙපාර්ශවයේ පිළිතුරුද අනුව කොමිෂන් සභාව විසින් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරයි.

පැමිණිලිකරු උප පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස 1986.02.10 දින පොලිස් සේවයට ඇතුළත්ව 1993.03.20 දින පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීමක් ලබා 2006.04.21 දින ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරටද උසස්වීමක් ලබා දිවයිනේ බොහෝ ප්‍රදේශ වල පිහිටි පොලිස් ස්ථාන තුල සේවය කර අවසන් පොලිස් ස්ථානය ලෙස වැලිකඩ පොලිස් ස්ථානයේ රාජකාරි කටයුතු සිදු කර ඇති බව නිරීක්ෂණය වේ. එහිදී කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයට ස්ථාන මාරුවීමක් ලබා ඇති අතර අසනීප තත්වයෙන් පසුවූ පැමිණිලිකරු පොලිස් අභ්‍යාස විද්‍යාලයේ රාජකාරි සඳහා වාර්තා නොකර අසනීප නිවාඩු ඉල්ලා ඇති බවද නිරීක්ෂණය වේ. පැමිණිලිකරු තමා හට සේවය අතහැර යාමේ නියෝගය ලද දිනය වන 2007.12.24 වන දින සිට දින 7 ක් ඇතුලත තමා සේවය අතහැර යාමක් සිදු නොකල බව දන්වා වගඋත්තරකරුවන්ට ඉදිරිපත් කල අභියාචනය ලියාපදිංචි තැපැල් මගින් ඉදිරිපත් කර ඇති අතර, ඔහු චෝදනාවට දන්වා ඇත්තේ ඒවා ඉදිරිපත් කර තිබියදී ඒවා නොලද බව සලකා වගඋත්තරකරුවන් කටයුතු කල බවය. ඒවා ලද බවට දැනුම්දීමක් හෝ නොකල බව නිසියාකාරව වගඋත්තරකරුට බාර දුන් බව සහතික කරමින් තැපැල් දෙපාර්තමේන්තුව සහතික කල පෝරමයද පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පොලිස් අධිකාරි විසින් එකී ලිපිය භාර ගත් බවට ලිපි භාර ගැනීමේ ලේඛනයේ සටහන් කර ඇති ලේඛනයද ඉදිරිපත් කරමින් පැමිණිලිකරු තම කරුණු සහතික කර ඇත. පැමිණිලිකරුගේ අභියාචනය පිළිබඳව සලකා බැලීමට ආයතන සංග්‍රහයේ නීතිමය ප්‍රතිපාදන ඇතත් වගඋත්තරකරුවන් අභියාචනය ලද විගස එය සලකා බලා නොමැති බව මේ අනුව නිරීක්ෂණය වේ.

2010.05.07 දින පැමිණිලිකරු පොලිස් මූලස්ථානයටද රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාටද අභියාචනයක් නැවත ඉදිරිපත් කරමින් සහන ඉල්ලා සිටියද සහන නොලද බැවින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට තම මූලික අයිතිවාසිකම් කඩවීම යටතේ මෙම පැමිණිල්ල ගොනු කල බව දන්වා ඇත. පොලිස් මූලස්ථානය වෙත ඉදිරිපත් කල අභියාචනය වෙනුවෙන් කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂක විසින් මූලස්ථානය කල විමසීමකට අනුව දන්වා යවා ඇත්තේ පැමිණිලිකරුගේ නොකැලැල් සහ දීර්ඝ සේවා කාලයද දක්ෂතාවයන්ද පිළිබඳව සලකා බලා නැවත සේවය ලබා දෙන ලෙසට ඉදිරිපත් කර ඇති නිර්දේශයක් බව නිරීක්ෂණය වි ඇත.

මෙම පැමිණිල්ල 2007.11.19 දින පැමිණිලිකරු බිරිඳගේ මහ ගෙදර සිටියදී කිහිප දෙනෙකු පැමිණ විමසා තර්ජණය කිරීමක් සම්බන්ධව සහ වැලිකඩ පොලිස් ස්ථානය ඉදිරියේ රාත්‍රියේ පැමිණ අහසට වෙඩි තබා යාමක් පිළිබඳව තම ආරක්ෂාව සඳහා කල පැමිණිල්ලක් ලේඛන තුළින් තහවුරු කර ඇති බවට නිරීක්ෂණය වේ. 2008.10.13 දින පැමිණිලිකරු හට වෙඩි තබා ඝාතනය කිරීම සඳහා යතුරු පැදියකින් පැමිණි පුද්ගලයින් දෙදෙනෙකු උත්සාහ දරන බව දක්වා ගොනු කල පැමිණිල්ලක් ඇති බවද නිරීක්ෂණය වේ. 2007.11.25 දින විෂ සහිත සර්පයෙකු දෂ්ඨ කිරීමේ හේතුව මත ශරීරය පුරා තුවාල සෑදී රෝගී භාවයකට පත්වීම පිළිබඳව

පැමිණිලිකරු කියා සිටින්නේ ජීවිතයට තිබූ මරණීය තර්ජන හේතුවෙන් ද වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට අවශ්‍ය බැවින් ද වෛද්‍ය වාර්තා ඉදිරිපත් කළ කාලසීමාවේ මාසයක කාලයක් විදේශ ගතවූ බව සත්‍යයක් බවට පැමිණිලිකරු පිළිගෙන ඇත. නමුත් එය තම සේවය අතහැර යාමේ නියෝගයට හේතුවී නොමැති බවද වෛද්‍ය සහතික ඉදිරිපත් කර තිබියදී ඒවා නොලද බව දක්වා තම සේවය අවසන් කර තිබීම ද්වේශ සහගතව සිදු කර ඇති බවද සඳහන් කර ඇත.

නියමිත පරිදි නිවාඩු අනුමත කිරීමකින් තොරව විදේශ ගතවීම නැවත සේවය ලබා නොදීමට තරම් බරපතල ගණයේ විනය කඩ කිරීමක් නොවන බව පෙන්වා දිය යුතුය. සේවය අතහැර යාමේ නියෝග වලට ලක්වූ බොහෝ අය ඉදිරිපත් කළ අභියාචනා සලකා බලා නැවත සේවයේ පිහිටුවා ඇති බව පොලිස් දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ යෙදී සිටින සේවය අතහැර යාමේ නියෝග ලබා පසුව සේවය කරන නිලධාරීන් දෙස බැලීමේදී අනාවරණය වේ. නියමිත පරිදි නිවාඩු අනුමත කිරීමකින් තොරව විදේශ ගතවීමේ චෝදනාවට තරවටු කිරීම යන ආයතන සංග්‍රහයේ II වන උප ලේඛනයේ දක්වා ඇති දඬුවමක් ලබාදී සේවය පිහිටුවා ඇති නිලධාරීන් ද සිටින බව ලේඛන ඉදිරිපත් කරමින් තහවුරු කර ඇත. එකී ලේඛනය අනුව අධ්‍යක්ෂක විනය හා නල්ක්‍රියා අංශය විසින් පොලිස් මූලස්ථානය වෙනුවෙන් එකී ලිපිය ඉදිරිපත් කර ඇති බවද එක් නිලධාරියෙකු සම්බන්ධව එසේ කටයුතු කර ඇති බවද දක්වා ඇත. එවැනි ආකාරයකට අභියාචනා සලකා බලා නැවත සේවයේ පිහිටවූ නිලධාරීන් බොහෝ සිටින බව පැමිණිලිකරු කියා සිටින අතර ඒ අනුව පැමිණිලිකරුගේ අභියාචනය නොසලකා හැරීම සලකා බැලිය යුතු කාරණාවක් බව පෙන්වා දිය යුතුය. පැමිණිලිකරු තලෙයිමන්නාරම වැනි දුෂ්කර පොලිස් ස්ථාන වල ස්ථානාධිපති ලෙස පවා සේවය කර ඇති අතර, ස්ථානාධිපතිවරයෙකු ලෙස බෙලිඅත්ත පොලීසියේද, යක්කලමුල්ල පොලීසියේ ද බස්නාහිර පළාත් විශේෂ විමර්ශන ඒකකයේ ද, බෝමුරුඇල්ල විශේෂ පුහුණු කඳවුරේ ද, වැලිකඩ පොලීසියේ ද සේවය කරමින් සිටි අයෙකු බව තහවුරු වී ඇත. ඒ අනුව පැමිණිලිකරුගේ අභියාචනය ද්වේශ සහගතව නොසලකා හරින ලද බවට පැමිණිලිකරු කියා සිටින කරුණු සනාථ වන්නේ ආයතන සංග්‍රහයේ සේවය අතහැර යාමේ නියෝග සම්බන්ධව අභියාචනා කිරීමේ හැකියාව පිළිබඳව දක්වා ඇතත් එසේ සිදු කළ අභියාචනය මුල් අවස්ථාවේදී වගඋත්තරකරුවන් විසින් නොසලකා හැර ඇති බැවිනි.

තවද 2014.02.12 දින පොලිස්පති වෙත හා අධ්‍යක්ෂක පොලිස් අභ්‍යාස විද්‍යාලය වෙත යවන ලද ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කරමින් කොමිෂන් සභාව විසින් විසඳිය යුතු ප්‍රශ්න 10 ක් වෙත අවශ්‍ය පිළිතුරු ලබා දෙමින් වගඋත්තරකරුවන් පහත කරුණු ඉදිරිපත් කර ඇත. එනම්

පැමිණිලිකරුගේ වෛද්‍ය වාර්තාව අනුව 2007.12.05 දින දක්වා නිවාඩු අනුමතව ඇති බැවින් පැමිණිලිකරු පසුව තවදුරටත් නිවාඩු රහිතව සේවයට වාර්තා නොකර සිටියේ නම් ඒ බව දන්වා පැමිණිලිකරුට වහා සේවයට වාර්තා කරන ලෙස ලිඛිතව දන්වා තිබුණේද යන්න

සම්බන්ධයෙන් පොලිස්පතිවරයා වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, එම දැනුම්දීම කළයුතු වන්නේ පොලිස් අභ්‍යාස විද්‍යාලය විසින් බවය. තවද එම දැන්වීම සේවය අතහැර යාමේ නියෝගයක් ලෙස දන්වා එවැනි දැනුම්දීමක් කළ බව පොලිස්පති වෙත දැනුම්දීම හෝ එවැනි දැනුම්දීමක් කිරීම සුදුසු බවට නිර්දේශයක් පොලිස්පති වෙත ලබා දියයුතු බව දන්වා ඇත. එවැනි දැනුම්දීමක් පොලිස්පති වෙත මුල් අවස්ථාවේදී පැමිණිලිකරුගේ අනුමත නිවාඩු අවසන් වූ පසු නිකුත් කළ බවට වාර්තා වී නොමැති බවද මුල් අවස්ථාවේ පොලිස්පති විසින් සේවය අතහැර යාමේ නියෝගයක් නිකුත් නොකළ බවද සඳහන් කර ඇත.

මේ සම්බන්ධව කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂක වෙනුවෙන් පැමිණි නිලධාරී මහතා ප්‍රකාශ කර ඇත්තේ, එවකට පවත්වාගෙන ගිය ලිපිගොනු අනුව 2007.12.07 දින ශ්‍රී ලංකා පොලිස් අභ්‍යාස විද්‍යාලය මගින් වේයන්ගොඩ පොලිස් ස්ථානය හරහා දුරකථන පණිවිඩයක් ලබා දෙමින් සේවයට වාර්තා කිරීමට දන්වා සිටි බවය. නැවත 2007.12.10 දින වැලිකඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති හරහා රාජකාරියට වාර්තා කරන ලෙස පැමිණිලිකරුට පණිවිඩ ලබාදී තිබූ බවද එදිනම නුගේගොඩ පොලිස් අධිකාරී කොට්ඨාශය හරහා එම පණිවිඩය ලබාදීම සිදුකළ බවද සඳහන් කර ඇත. තවද වේයන්ගොඩ පොලිස් ස්ථානාධිපති විසින් පිළිතුරු පණිවිඩයක් ලබා දුන් බව 2007.12.12 දින පොලිස් අභ්‍යාස විද්‍යාලයට පිළිතුරු පණිවිඩයක් මගින් දක්වා සිටි බවට සඳහන් කර ඇති අතර ඉන් කියා ඇත්තේ පැමිණිලිකරුගේ වේයන්ගොඩ ප්‍රදේශයේ පිහිටා තිබූ නිවස වසා තිබූ බැවින් යාබද නිවසක පදිංචි පී.ආර්.ජ්. සුනිල් යන අයට පණිවිඩයේ පිටපතක් ලබා දුන් බවට වන බවද සඳහන් කර ඇත.

පැමිණිලිකරු මෙම පණිවිඩ අතරින් මුල් පණිවිඩය ලද බව පිළිගන්නා අතර පසුව දන්වන ලද පණිවුඩ තමාට ලැබී නොමැති බවත් එවකට තිබූ අසනීප තත්වය මත වෛද්‍ය වාර්තා මගින් නැවතත් සේවයට නොපැමිණීමට හේතු වාර්තා කළ බවත් දන්වා ඇත. ඒ බව පැමිණිලිකරු ඉදිරිපත් කරන ලද වෛද්‍ය වාර්තා අනුව තහවුරු වී ඇත.

පැමිණිලිකරු තම රෝගීභාවය දක්වා ඉදිරිපත් කරන ලද විෂ වෙදකමට අදාළ වෛද්‍යවරයෙක් මගින් ඉදිරිපත් කරන ලද වෛද්‍ය සහතික සලකා බලන ලද්දේද හා එසේ සලකා නොබලන ලද්දේ නම් ඊට හේතුව ලෙසට පොලිස්පති වෙනුවෙන් පැමිණි නිලධාරීන් දන්වා ඇත්තේ මේ පිළිබඳ වගකීම ඇත්තේ කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයට බවය.

කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලය වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු ඉදිරිපත් කරන පළමු වෛද්‍ය වාර්තාවට අනුව නිවාඩු නිර්දේශ කර ඇත්තේ 2007.11.22 දින සිට 2007.12.06 වන තුරු දින 14 කට පමණක් බවය. 2007.12.17 දින වනතුරු පැමිණිලිකරු සේවයට වාර්තා නොකළ බැවින් හා වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර නොමැති බැවින්

සේවය අතහැර යාමේ නිවේදනය නිකුත් කළ බවට සඳහන් කර ඇත. විෂ වෛද්‍යවරයෙකුට අදාල වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කර ඇත්තේ 2007.12.16 දිනදි බවද 2007.12.26 දින එය ලැබී ඇති බවද ඒ එනවිට සේවය අතහැර යාම දන්වා යවන ලද ලිපිය පැමිණිලිකරුට ලැබී තිබිය යුතු බවද සඳහන් කර ඇත.

අදාල 2007.12.16 දිනැති වෛද්‍ය වාර්තාව සම්බන්ධව සලකා බලා ගන්නා ලද පියවර සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ ආයතන සංග්‍රහයේ පළමු කාණ්ඩයේ 5 වන පරිච්ඡේදයේ ඡේද අංක 7 අනුව තනතුර අතහැර යාම සම්බන්ධව දක්වා ඇති බවද, ඒ අනුව නිවාඩු ලබා නොගෙන රාජකාරියට වාර්තා නොකරන්නේ නම් සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කරන බවද වේ. නිලධාරියාට ලියාපදිංචි තැපෑලෙන් හෝ පෞද්ගලිකව ලිපියක් බාරදී ඒ බව වහාම දැන්විය යුතු වන අතර පැමිණිලිකරුට අභියාචනයක් කිරීමට ආයතන සංග්‍රහයට අනුව හැකි බවද සේවය අතහැර යාමේ ලිපිය ලැබී මාස 03 ක් ගතවීමට පෙර අභියාචනා ඉදිරිපත් කළයුතු බවද සුදුසු අඩුවම් පමුණුවා නැවත සේවයේ පිහිටුවීම සිදු කළ හැකි බවද සඳහන් කර ඇත. එසේම විනය නිලධාරියා සේවය පිහිටුවීම ප්‍රතික්ෂේප කර සිටින විට මාස 06 ක් ඇතුලත රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ අමාත්‍ය මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කල හැකි බවද පැමිණිලිකරුගේ අභියාචනයක් මාස 03 ක් ඇතුලත ලබාදී නොමැති බවද එවැනි අභියාචනයක් විනය බලධාරියා විසින් ප්‍රතික්ෂේප කළබව වාර්තා වී නොමැති බවද වගඋත්තරකරුවන් විසින් ප්‍රකාශ කර ඇත.

නමුත් 2007.11.22 දින පැමිණිලිකරු ගම්පහ අධිකරණ වෛද්‍ය නිලධාරිවරයාගෙන් දින 14 ක් සඳහා වෛද්‍ය සහතිකයක් කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂවරයාට ඉදිරිපත් කර ඇති බවද, පසුව එම නිවාඩුව අවසන් වන අවස්ථාවේදීම 2007.12.17 වන දින විෂ වෙදකම හා සම්බන්ධ වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් ලියාපදිංචි තැපැල් මගින් ඉදිරිපත් කර ඇති බවද කොමිෂන් සභා පරීක්ෂණයේදී නිරීක්ෂණය වී ඇත.

පැමිණිලිකරු තම පැමිණිල්ල සමග ඉදිරිපත් කළ ලේඛන මගින් වැඩිදුරටත් තහවුරු කර ඇත්තේ එම වෛද්‍ය වාර්තා වගඋත්තරකරුවන් වෙත ලැබී ඇති බවද සේවය අතහැර යාමේ නියෝගය ලද පසු වගඋත්තරකරුවන්ට ඉදිරිපත් කළ අභියාචනය වගඋත්තරකරුවන් වෙත හරියාකාරව 'ලැබී ඇති බව පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පොත්පත් හා ලේඛන වල වාර්තා වූ ආකාරය අනුව තහවුරු වී ඇති බවද වේ. එසේම ලියාපදිංචි කළ ලිපි වගඋත්තතරකරුවන්ට ලැබී ඇති බව ඒට අදාල ලේඛන ඉදිරිපත් කරමින් පැමිණිලිකරු විසින් තහවුරු කර ඇත. වගඋත්තරකරු එකී ලේඛන තුළ ඇති කරුණු පිළිබඳ විරෝධතා හෝ ඒට එරෙහිව කරුණු ඉදිරිපත් කිරීමක් සිදු කර නොමැත.

ආයතන සංග්‍රහයේ ඇති නියමයන්ට අනුව පැමිණිලිකරුගේ පළමු අභියාචනය සම්බන්ධව කිසිදු පියවරක් ගෙන නොමැති බව නිරීක්ෂණය වේ. දෙවන අභියාචනය 2010.07.05 වන දින පොලිස්පති වෙත ඉදිරිපත් කල පසු කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ හිටපු නියෝජ්‍ය පොලිස්පති (මූලික පුහුණු) විසින් පැමිණිලිකරු කැඳවා පරීක්ෂණයක් පවත්වා ඒ පිලිබඳ වාර්තාවක් 2010.05.18 දින එවකට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අජිත් වික්‍රමසිංහ මහතාගේ අත්සනින් යුතුව යවා ඇති බවද නිරීක්ෂණය වේ. එකී අභියාචනයට අනුව "පැමිණිලිකරුගේ දීර්ඝ සේවා කාලය හා නොකැළැල් සේවය සලකා නැවත සේවය පිහිටුවීම නිර්දේශ කරමි" ලෙසට දක්වා ඇත. එකී ලිපිය නියෝජ්‍ය පොලිස්පති මඟින් පොලිස්පති වෙත යොමු කලබව වාර්තා වේ.

පොලිස් අභ්‍යාස විද්‍යාලය සතුව පැවති ලේඛන වල ඡායා පිටපත් ඉදිරිපත් කරමින් පැමිණිලිකරු විසින් තම පැමිණිල්ලට අදාල සියලු කරුණු අමුණා ඉදිරිපත් කර ඇත. කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලය වෙනුවෙන් පැමිණි වගඋත්තරකරු තවදුරටත් එකී ලේඛන සහතික හා අනියාවනා නොලද බව ප්‍රකාශ කර සිටීම පිළිගත නොහැකි කාරණාවක් බව පෙන්වා දිය යුතුය.

පැමිණිලිකරුගේ පැමිණිල්ලක් පිලිබඳව සලකා බලා අවසන් වාර්තාවක් පොලිස්පති වෙත ඉදිරිපත් කරමින් කියා සිටින ලද කරුණු සම්බන්ධව ද නිසි පරිදි සලකා බලා නොමැති බව අනාවරණය වේ. "සියලුම වගඋත්තරකරුවන් සහ පැමිණිලිකරුද කාරක සභාවද අතර ඇතිවූ සාකච්ඡාවේදී එළඹි තීරණය පහත පරිදි දැනුම් දෙන බවට 2012.01.26 දින පොලිස්පති වෙත මහජන පෙත්සම් සභා කාර්යාලය විසින් දන්වා ඇත. එනම්, පැමිණිලිකරු තම පැමිණිල්ල තුළ ඇති කරුණු නිවැරදි ලෙස ලේඛන ඉදිරිපත් කරමින් තහවුරු කර ඇති බැවින් තනතුර අතහැර ගියා සේ සලකා කටයුතු කිරීම අසාධාරණ බව කාරක සභාවට හැඟී යන බවද මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදු කලයුතු බවද වේ. පැමිණිලිකරු ඉදිරිපත් කර සිටින කරුණු අනුව බැලූ බැල්මට අසාධාරණයක් සිදුවී ඇති බවද වසර 20 කට වඩා අධික සේවා පළපුරුද්දක් ඇති නිලධාරියෙකු බැවින්ද නැවත සේවය පිහිටුවීමට ඇති හැකියාව සම්බන්ධව පොලිස්පති පෞද්ගලිකවම සොයා බලා රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කළයුතු බවද එහි දක්වා ඇති බවද නිරීක්ෂණය වේ. කාරක සභාවේ නියමය පරිදි ඒ බව දන්වා සිටින බවද පැමිණිලිකරු සම්බන්ධ පරීක්ෂණ වල ප්‍රගතිය මාස 2 ක් තුළ වාර්තා කරන ලෙසද නියම කරමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට පිටපතක් ඉදිරිපත් කරමින් පැමිණිලිකරු අදාල පරීක්ෂණ වලට කැඳවා ඔහුට සාක්ෂි ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දෙන ලෙසද දන්වා ඇති බවද තමුන් මෙකී සියලු කරුණු උල්ලංඝනය කරමින් මහජන පෙත්සම් කාරක සභාවේ නියමයන් පැහැර හරිමින් පැමිණිලිකරු සම්බන්ධව පොලිස්පති මැදිහත්වීමක් සිදු කර නැති බවද රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පැමිණිලිකරුට ඉදිරිපත් වීමට අවස්ථාවක් ලබාදී නොමැති බවද ආයතන සංග්‍රහය යටතේ ඇති නීතිරීති අනුව පැමිණිලිකරුගේ අභියාචනය සලකා බලා නොමැති

බවද සේවය අතහැර යාමේ නියෝගයට එරෙහිව යුක්තිසහගත හා සාධාරණ වූ ආකාරයකට පැමිණිලිකරුට සවන්දීමක් හෝ සිදු කර නොමැති බවද නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

පැමිණිලිකරු සේවයට වාර්තා කිරීමට නොහැකිවීමට හේතු වෛද්‍ය සහතික මගින් තහවුරු කර ඇති අතරම එකී වෛද්‍ය සහතික වගඋත්තරකරුවන්ට ලැබී ඇති බවද තහවුරු වී ඇත. නමුත් පැමිණිලිකරු වෛද්‍ය සහතික ඉදිරිපත් කර තිබියදී සේවය අතහැර යාමේ නියෝගය නිකුත් කර ඇති බව අනාවරණය වී ඇත. කෙසේ වෙතත් සේවය අතහැර යාමේ නියෝගය ලද පසු ඊට එරෙහිව කරුණු දක්වා සේවය අතහැර යාමේ නියෝගය ඉවත් කර නැවත සේවයේ පිහිටුවා ගැනීමට පැමිණිලිකරු ආයතන සංග්‍රහයේ ඒ සඳහා ඇති නියමිත කාලසීමාව තුළ අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවද නිරීක්ෂණය වී ඇත.

ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ 48 වන පරිච්ඡේදයේ ජේද 37 හි ට අනුව "ආයතන සංග්‍රහයේ පළමු වන කාණ්ඩයේ 5 වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ සේවය අතහැර යාමේ නිවේදනයක් ලබා සිටින නිලධාරියෙකු එම නිවේදනයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ නම් එවැනි අභියාචනයක් සේවය අතහැර යාමේ නිවේදනය නිකුත් කොට මාස 3 ක් ඉකුත් වීමට පෙර නියි විනය බලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු" බවට දක්වා ඇත. "අභියාචනය පිළිගත හැකි අවස්ථාවකදී අවසර නොලබා සේවයට වාර්තා නොකිරීම සම්බන්ධව සුදුසු දඬුවම් පමුණුවා නැවත සේවයේ පිහිටුවීමට නියෝග කිරීමට විනය බලධාරියාට බලය ඇති බවට සහ විනය බලධාරියා විසින් සේවයේ පිහිටුවීම ප්‍රතික්ෂේප කර ඇති විට නියෝගය ලබා දුන් දින සිට මාස 6 ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කිරීමට බලය ඇති බවටද" එහි සඳහන්ව ඇත.

පැමිණිලිකරු අභියාචනයක් ඉදිරිපත් කළද එය නොසලකා හැර ඇති අතර ඔහුට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් වීමට හෝ හැකියාව ලැබෙන පරිදි එකී අභියාචනය ප්‍රතික්ෂේප කිරීමක් සිදු කර නොමැති බවද නිරීක්ෂණය වේ. 2011 ජූනි මස 13 වන දින සිට පොලිස්පති චක්‍රලේඛ අංක 2278/2011 අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව නැවත පත් කරන තුරු පොලිස් නිලධාරීන් සම්බන්ධව උසස් කිරීම් පත්කිරීම් සම්බන්ධව බලතල තිබී ඇත්තේ ද පොලිස්පතිට හා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වරයාට වේ. නමුත් එවැනි අවස්ථාවකදීද මෙම අභියාචනය පිළිබඳව සලකා බලා නොමැති බවද අනාවරණය වී ඇත. 2011.03.31 දින නැවත සේවය පිහිටුවීම අනුමත නොකරන බව දක්වා පොලිස්පති වෙත රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් ලිපියක් ලබාදී ඇතත් එසේ නැවත සේවය පිහිටුවීම අනුමත නොකිරීමට හෝ පැමිණිලිකරු කැඳවා කරුණු විමසා බැලීමක් සිදු කර ඇති බව අනාවරණය වී නොමැත.

දෙපාර්ශවයට ඇහුම්කන් දියයුතු බවට වූ සර්ව සාධාරණත්වයේ රීතින් බිඳ හෙලීමක් සිදුව ඇති බව කිසිදු අවස්ථාවක පැමිණිලිකරුට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා නොදීමෙන් අනාවරණය වේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව පසුකාලීනව පැමිණිලිකරුගේ අභියාචනා ප්‍රතික්ෂේප කළද එයට හේතු ඉදිරිපත් කිරීමක් සිදුකර නොමැති අතර සේවය අතහැර යාමේ නියෝග ලබා සිටි බොහෝ පොලිස් නිලධාරීන් නැවත සේවයේ පිහිටුවා ඇති බව ද එකී වෙනත් නිලධාරීන්ගේ අභියාචනා සලකා බලා සහන ලබාදී ඇතත් පැමිණිලිකරුගේ අභියාචනා වගඋත්තරකරුවන් විසින් අත්තනෝමතික ලෙස නොසලකා ඇති බැව් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුගේ අභියාචනය නිසි අවස්ථාවේ ලද පසු සලකා බැලීමට වගඋත්තරකරුවන් කටයුතු කර නොමැති අතර අභියාචනය නියමිත කාලසීමාවේ වගඋත්තරකරුවන්ට ලැබී ඇති බව තහවුරු වී ඇත. පැමිණිලිකරුගේ වෛද්‍ය සහතික හා සේවය අතහැර යාමක් සිදු කර නොමැති බවට දක්වා ඇති ලේඛන වගඋත්තරකරුවන්ට නිසි අවස්ථාවේ ලැබී ඇති බව තහවුරු වී ඇතත් ඒවා සලකා බලා පියවර ගෙන නැති බව තහවුරු වේ. මේ අනුව පැමිණිලිකරු ඉදිරිපත් කළ අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රතික්ෂේප කර ඇත්තේ නිසි පරීක්ෂණයකින් තොරව බව තහවුරු වී ඇත. මහජන පෙත්සම් කාරක සභාව විසින් පැමිණිලිකරුගේ කරුණු සලකා බලා නැවත සේවය පිහිටුවීමට අදාලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හා පොලිස්පති වෙත සලකා බැලීමට දක්වා ඇති කරුණු පිළිබඳව නොසලකා හැර ඇති බවද අනාවරණය වී ඇත. සේවය අතහැර යාමේ නියෝග වලට එරෙහිව ලද අභියාචනා සලකා බලා සේවයේ පිහිටවූ නිලධාරීන් පිළිබඳව කරුණු අනාවරණය වන අතර පැමිණිලිකරුගේ සේවා කාලය පිළිබඳව හා නොකැඩැල් සේවා කාලය පිළිබඳව සලකා බලා පොලිස් අභ්‍යාස විද්‍යාලයේ හිටපු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විසින් පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවීමට කළ නිර්දේශය ද නොසලකා හැර ඇති බවද මේ අනුව නිරීක්ෂණය වී ඇත.

පැමිණිලිකරු සම්බන්ධව ආයතන සංග්‍රහය අනුව මුල් අවස්ථාවේ ඉදිරිපත් කළ අභියාචනයට අදාලව පියවර නොගැනීමෙන් පැමිණිලිකරුට නිසි අවස්ථාවේ සේවය නැවත ලබා ගැනීමට තිබූ අවස්ථාව වගඋත්තරකරකරුවන් විසින් අහිමි කර ඇති බවට නිරීක්ෂණය වේ. මෙකී සමස්ථ කරුණු අනුව වගඋත්තරකරුවන් තම විධායක හා පරිපාලන ක්‍රියාවන් තුලින් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති අතර ඉන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මින් නිගමනය කරමු.

නිර්දේශය :-

පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කළයුතු බවද හිග වැටුප් හා හිමිවිය යුතු වැටුප් වර්ධකද ලබාදී සේවය නවද්දුරටත් අඛණ්ඩව පැවති සේවයක් ලෙස සලකා කටයුතු කළයුතු බවද නිසි අවස්ථාවේ ඔහුට හිමිවිය යුතු උසස්වීම් සඳහා තිබූ අයිතිවාසිකම්ද උල්ලංඝනය වී ඇති බැවින් ඒ පිළිබඳ සලකා බලා හිමිවිය යුතු ආසන්න උසස්වීම ලබාදීමට අවශ්‍ය පියවර ගතයුතු බවද මින් නිර්දේශ කරන්නෙමු.

2016.ජූ. 01 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/ₒ